# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 655 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 16/04/2024<br>පැය 2020 |

## මාධ්‍ය නිවේදනය

**සමාජ මාධ්‍ය ජාලාවල සංසරණය වන වීඩියෝවකට අදාලව සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම - කෙසෙල්වත්ත පොලිස් ස්ථානය.**

ආහාර මිලදී ගැනීම සඳහා පැමිණි විදේශීය ජාතිකයෙකු විසින් ආහාර වල මිල ගණන් විමසීමෙන් පසු එය ප්‍රතික්ෂේප කිරීමත් සමඟ එම වෙළඳසැලේ හිමිකරු ලෙස පෙනී සිටින පුද්ගලයෙකු විසින්, එම විදේශ ජාතිකයාට අඩත්තේට්ටම් කරමින් ආහාර මිලදී නොගන්නේ නම් එම ස්ථානයෙන් ඉවත්ව යන ලෙසට තර්ජනාත්මකව බලපෑම් කරන වීඩියෝවක් සමාජ මාධ්‍ය ජාලාවල සංසරණය වෙමින් පවතී.

මෙම සිදුවීම කෙසෙල්වත්ත පොලිස් වසමේ අළුත්කඩේ ප්‍රදේශයේ street food නාමයෙන් ආහාර වෙළදාම් කරනු ලබන වීදියක සිදුව ඇති බවට අනාවරණය කරගෙන ඇත. ඒ අනුව එම වීඩියෝව පිළිබඳව වැඩිදුර විමර්ශන සිදු කර අදාල විදේශ ජාතිකයාට බැන තර්ජනය කිරීම හා අඩත්තේට්ටම් කිරීම යන චෝදනා සම්බන්ධයෙන් එම වෙළඳ සැලේ හිමිකරු ලෙස පෙනී සිටින පුද්ගලයාව 2024.04.16 වන අද දින කෙසෙල්වත්ත පොලිස් ස්ථානය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු 2024.04.17 වන දින අළුත්කඩේ ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. සිද්ධිය සම්බන්ධයෙන් කෙසෙල්වත්ත පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**